# අතීත අනාගත අසමමිතිය

අර්නස්ට් මාක් නම් දාර්ශනිකයා හා භෞතික විද්‍යාඥයා කියා සිටියේ ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප ඇසුරෙන් බටහිර භෞතික විද්‍යාව සූත්‍රගත නොකරන ලෙස ය. එනම් බටහිර භෞතික විද්‍යාව විස්තර කිරීමේ දී ඒ තේරුම්කර දීමේ දී ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප යොදා නොගන්නා ලෙස ය. මාක් විද්වතා පරමාණු පමණක් නොව අවස්ථිති සමුද්දේශ රාමු යොදාගැනීමට ද විරුද්ධ වූයේ ඒ ඉන්ද්‍රිය ගෝචර නොවන බැවිනි. අප ඒ ගැන වැඩි දුරටත් සාකච්ඡා කිරීමට පෙර කුණ්ඩලනී යෝගය ආදී පෙරදිග දැනුම සම්බන්ධ කරගනිමින් කාලය පිළිබඳ තවත් යමක් සඳහන් කළ යුතු ය.

කුණ්ඩලනී යෝගයට එළඹි යෝගියකුට භව ගණනක් ගෙවී ගිය අතීතය මතක් කරගත හැකි ය. එහෙත් එයින් කියැවෙන්නේ එවැන්නකුට අතීතයට යා හැකි බව නො වේ. අතීතයට යෑම යන්න අර්ථ රහිත ය. අතීතය වර්තමානයේ දී ද අනාගතයේ දී ද මතක් කරගත හැකි ය. එහෙත් අතීතය අතීතයේ දී මතක් කර ගැනීමට නො හැකි ය. යමකුට අඩුම තරමින් කලින් දිනට යා නො හැකි ය. එයට ප්‍රධාන හේතු වනුයේ ඒ කලින් දින අදාළ සිද්ධිවලට සහභාගි වූවන්ට ඒ ඒ තැන්වලට පැමිණීමට නො හැකි වීම ය. එහෙත් අපට අතීතය මතක් කරගැනීමේ බාධාවක් නැත. ඒ ඒ පුද්ගලයාගේ ස්මරණ ශක්තිය අනුව අතීතය මතක් කරගත හැකි ය. අප බොහෝ දෙනකුට අපේ ළදරු වියේ සමහර සිද්ධි මතක් කරගත හැකි ය. එහෙත් අපෙන් අති විශාල බහුතරයට අප මව්කුස සිටි ආකාරය පිළිබඳ කිසිදු මතකයක් නැත.

මේ කරුණෙන් අපට තවත් වැදගත් දෙයක් කිව හැකි ය. අපට යමක් මතක නැති පමණින් එවැන්නක් සිදු නොවී යැයි නිගමනය කළ නො හැකි ය. අප සියල්ලන්ට ම පාහේ මව්කුස සිටි ආකාරය මතක නැති නිසා අප මව්කුස නොසිටියේ යැයි නිගමනය කළ නො හැකි ය. එමෙන් ම අප සියල්ලන්ට ම පාහේ පෙර ආත්මභාව අමතක බැවින් පෙර භවයන් නොතිබිණි යැයි නිගමනය කළ හැකි නො වේ.

අතීතය යම් ප්‍රමාණයකට අපට මතක් කරගත හැකි වුව ද, අප කිසිවකුටවත් අතීතය වෙනස් කළ නො හැකි ය. වෛදික යෝග අභ්‍යාස මාර්ගයෙන් නොවුණ ද බෞද්ධයනට ද භාවනානුයෝගී වීමෙන් අතීතය මතක් කරගත හැකි ය. බුදුන් වහන්සේට අවශ්‍ය නම් කල්ප ලක්ෂ ගණනාවක් අතීතය දැකීමේ හැකියාව තිබිණි. සියලු ජාතක කතා පෙර භවවලට සම්බන්ධ ය. වර්තමානයේ මේ තැනැත්තා පෙර භවයක අහවලා යැයි බුදුන් වහන්සේ නොයෙකුත් අවස්ථාවල දේශනා කර ඇත. එයින් අදහස් වන්නේ කාලය යනුවෙන් සංකල්පයක් තිබෙන බව නො වේ. වෙනත් වචනවලින් කිවහොත් සෘජුව හෝ වක්‍රව හෝ ඉන්ද්‍රිය ගෝචර කාලයක් ඇති බවක් එයින් නිගමනය කළ නො හැකි ය. එමෙන් ම භවයෙන් භවයට යන ආත්මයක් ගැන ද ඉන් නො කියැවෙයි.

අපට අපේ ශක්ති ප්‍රමාණ අනුව අතීතය මතක්කර ගත හැකි වුව ද අතීතය වෙනස් කළ හැකි නො වේ. එසේ අතීතය වෙනස් කළ හැකි නම් කුමක් සිදුවේ ද? එවිට එතැන් සිට අප වෙනස් විය යුතු ය. එයින් අදහස් වන්නේ අද අප ජීවත්වන වර්තමානය අපට අහිමි වී අපට වෙනත් වර්තමානයක් ලැබෙන බව ය. පෙර භවවලට නොගොස් අපේ එදිනෙදා අත්දැකීම්වලට සීමා වෙමු. අහවල් ක්‍රීඩකයා අහවල් උඩපන්දුව රැක ගත්තේ නම් අපේ කණ්ඩායමට තරගය දිනාගත හැකි ව තිබිණි යැයි අපි කියමු. අප කිසිවකුට දැන් ඒ අතීතයට ගොස් ඒ වෙනස් කිරමේ හැකියාව තිබිණි යැයි ද සිතමු. අතීතයට යෑම යනු ඒ අවස්ථාවට අප සියලු දෙනාම රැගෙන යෑම ය. එසේ සියලු දෙනා ම ඒ අතීතයට රැගෙන ගොස් ඒ උඩපන්දුව රැක්ක වී යැයි සිතමු. එහෙත් ඉන්පසු කුමක් සිදු වීමට තිබිණි දැයි අපි දනිමු ද?

අපට කිව හැක්කේ තරගය වෙනස් මගක යෑමට අවස්ථාව සැලසුණු බව පමණ ය. සමහර විට අපේ කණ්ඩායමට තරගය දිනාගැනීමට හැකි වීමට තිබිණි. ඒ උඩපන්දුව රැගත්ත ද තවත් උඩපන්දු කිහිපයක් පසුව ගිලිහීමෙන් අපේ කණ්ඩායම පරාජය වීමට ද තිබිණි. ඒ උඩපන්දු හා අවස්ථා කවරේදැයි අපි නො දන්නෙමු. අදාළ උඩපන්දුව රැකගැනීමෙන් පසුව වෙනත් ම තරගයක් ක්‍රියාත්මක වෙයි. එහෙත් ඒ නව තරගය ක්‍රියාත්මක කළ නොහැකි බව අපි දනිමු. එකී උඩපන්දුව අත්හැරීම නිසා කම්පනයට පත් ව මියගිය අයකු උඩපන්දුව රැක්කවීම නිසා නැවතත් ජීවත්වන්නේ ද? පුනරුත්පත්තියක්, පුනබ්භවයක් ගැන විශ්වාසයක් නොමැත්තකුට වුවත් ඒ ප්‍රශ්නය අදාළය .

© Prof. Nalin De Silva

අතීතය මතක් කරගත හැකි වුවත් අතීතය වෙනස් කළ නො හැකි ය. අතීතය හේතුවෙන් වර්තමානය ඇති වී තිබේ. ඒ අතීතය නොවන්නට මේ වර්තමානය නැත. ඒ ඒ හේතු නිසා මේ මේ ඵල ඇතිවෙයි. ඒ ඒ හේතු නොවන්නට මේ මේ ඵල නොමැත. අපට ඇත්තේ එවැනි හේතුඵල ධර්මතාවක් මිස ඊනියා කාලයක් නො වේ. බුදුන් වහන්සේ අතීතය දුටු නමුත්, එනම් අතීතය මතක් කරගත් නමුත් අතීතය වෙනස් නො කළහ. සත්ත්වයා කෙරෙහි මහාකරුණාවක් දැක් වූ බුදුන් වහන්සේ සත්ත්වයාගේ යහපත පිණිස අතීතය වෙනස් කළ හැකි වී නම් අතීතය වෙනස් නොකර සිටිනු ඇත් ද?

බුදුන් වහන්සේ අතීතය වෙනස් නොකළ ද අනාගතය වෙනස් කළහ. අතීතය සිදු වී හමාර ය. එහෙත් අනාගතය ගැන කිව හැක්කේ ඒ සිදුවීමට හැකි බව පමණ ය. අද භාවිතා කරන සංකල්ප යොදාගන්නේ නම් අනාගතය සිදුවීමට ඇත්තේ සම්භාවිතාවකි. අවශ්‍ය නම් ඒ වෙනස් කළ හැකි ය. අහිංසක හෙවත් අංගුලිමාල තම මව මරා ආනන්තරීය පාප කර්මයක් කිරීමට සූදානම් ව සිටියේ ය. බුදුන් වහන්සේ ඒ බව දුටුසේක. එහෙත් අනාගතයට අයත් ඒ සිදුවීම තවමත් සිදු වී නැති බැවින් ඒ වෙනස්කිරීමේ හැකියාව තිබිණි.

මව මැරී නම් අංගුලිමාල දිර්ඝ කාලයක් අපාගත වීමට තිබිණි. එහෙත් ඔහු කුසල් පිරූ පුද්ගලයෙක් ද විය. ඔහුට නිවන් අවබෝධ කර ගැනීමේ හැකියාව ද විය. බුදුන් වහන්සේ ඒ තීරණාත්මක දිනයේ ලෝ සතුන් කෙරෙහි මහා කරුණාවෙන් ලොව බලන කල දුටුවේ මේ තුං මං හන්දියේ සිටි අංගුලිමාලය. බුදුන් වහන්සේ අංගුලිමාලගේ අනාගතය තීරණය කිරීමේ දී මැදිහත් වූහ. ආනන්තරිය පාප කර්මයක් කිරීමට සිටි අංගුලිමාල නිවන් අවබෝධ කෙළේ ය. අනාගතය ගැන අපට නියත වශයෙන් යමක් කීම උගහට ය. අසවල් සිද්ධිය සිදුවීමට අසවල් සම්භාවිතාව ඇතැයි යන්න හැරෙන්නට අපට කිව හැකි දෙයක් නැත.

අනාගතය දැක ඒ වෙනස්කිරීමට බුදුන් වහන්සේ ක්‍රියාකළ ආකාරයට අපට ක්‍රියාකළ නොහැකි වුවත් අපි ද අපේ මෙන් ම අන් අයගේ ද අනාගතය වෙනස් කරන තීරණ ගනිමු. අපට විකල්ප ක්‍රියා මාර්ග දෙකක් හෝ වැඩි ගණනක් හෝ ඇතිවිට අපි එක් විකල්පයක් තෝරා ගනිමු. එසේත් නැතහොත් වෙනත් අයකුට එලෙස එක් විකල්පයක් තෝරා ගැනීමට උපදෙස් දෙමු. එවැනි අවස්ථාවල දී අපි අනාගතය වෙනස් කරමු. එනම් අනාගතය ඒ ආකාරයෙන් (වෙනත් ආකාරයකින්) නොව මේ ආකාරයෙන් සිදුවිය යුතු යැයි තීරණය කරමු. අනාගතය යම් ප්‍රමාණයකට අපට සකස්කර ගත හැකි ය. එහෙත් අපට අතීතය අපට අවශ්‍ය අන්දමට තීරණය කළ නො හැකි ය. අතීතය සිදු වී අවසන් ය. අතීතය, අතීතයට අයත් වෙයි.

එහෙත් සාමාන්‍ය ලෝකයේ අනාගතය ගැන අපට යම් යම් තීරණ ගත හැකි ය. අනාගතය තවම සිදු වී නැත. අපට අනාගතය ගැන කිව හැක්කේ සම්භාවිතා යොදා ගනිමිනි. එහෙත් මේ සම්භාවිතා ක්වොන්ටම් භෞතිකයේ සම්භාවිතාවලට වඩා වෙනස් වෙයි. හෙට ඉර පායන බවට අපට ඇත්තේ තදබල විශ්වාසයකි. එසේ නොවීමටත් ඉඩ ඇත. එහෙත් ඒ සඳහා ඇති සම්භාවිතාව ඉතා කුඩා ය.

සාමාන්‍ය ලෝකයේ ඕනෑම අවස්ථාවක එක්කෝ ඉර පායා ඇත. නැත්නම් ඉර පායා නැත. ඉර පෑයූ මෙන් ම ඉර නොපෑයූ අවස්ථාවක් එහි නො වේ. එහෙත් ක්වොන්ටම් භෞතිකයේ එවැනි අවස්ථා ඇත. ඉර පායා ඇත්දැයි දැන ගැනීමට අප නිරීක්ෂණයක් කළ යුතු ය. නිරීක්ෂණයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉර පායා ඇත් ද එසේත් නැත්නම් ඉර පායා නැත් ද යන්න දැනගත හැකි ය. ඒ නිරීක්ෂණය කරන තෙක් ඉර පායා ඇත් ද නැත් ද යන්න අපට දැනගත නො හැකි ය. අපට කිව හැක්කේ ඉර පෑයීමට අසවල් සම්භාවිතාව ඇති බව පමණ ය. වාසනාවකට ඉර ක්වොන්ටම් අංශුවක් නොවන බැවින් එවැනි තත්ත්වයකට මුහුණ පෑමට අපට සිදු නො වෙයි.

ඒ කෙසේ වෙතත් නිව්ටෝනීය හෙවත් සම්භාව්‍ය භෞතිකයේ මෙන් ම ක්වොන්ටම් භෞතිකයේ ද අනාගතය නිශ්චිතව කිව නො හැකි ය. එහෙත් ඒ සෑම තැන ම අතීතය නිශ්චිත ය. ඒ සිදු වී අවසාන ය. කාලය සම්බන්ධයෙන් එවැනි අසමමිතික බවක් අතීතය හා අනාගතය සම්බන්ධයෙන් පවතියි. ජ්‍යොතිෂයෙහි ද අනාගතය සම්බන්ධයෙන් නිශ්චිත ව යමක් කිව නො හැකි ය. එහි දී කෙරෙන්නේ වෙනත් හේතු කිසිවක් නැත්නම් යම් අයකුට හුදු ග්‍රහ බලපෑම් නිසා ම

© Prof. Nalin De Silva

මෙවැනි අනාගතයක් තිබීමට ඉඩක් ඇතැයි පැවසීම ය. ග්‍රහ බලපෑම්වලට අමතරව තවත් හේතු රාශියක් ඇති බැවින් යමකුගේ අනාගතය ගැන ජ්‍යොතිෂයෙන් කළ හැක්කේ මග පෙන්වීමක් පමණි.

කාලය සම්බන්ධයෙන් එවැනි අසමමිතික බවක් තිබිණි ද, අවකාශය සම්බන්ධයෙන් එවැන්නක් කිව නො හැකි ය. මෙහි දී අයින්ස්ටයින් විද්වතා අවකාශය සම්බන්ධයෙන් කියා ඇති කරුණක් සිහියට නැගෙයි. ඔහු කියා ඇත්තේ අවකාශය සම්බන්ධයෙන් කිසිම සංකල්පයක් තනා ගැනීමට නො හැකි බව ය. මේ පිළිබඳ විස්තරයක් කිරීමට මේ අවස්ථාව නො වේ. එහෙත් කිව යුත්තක් නම් ද්‍රව්‍යයෙන් හා කිරණයෙන් වියුක්ත වූ අවකාශයක් යන්න සංකල්පයක් ලෙස ඉදිරිපත් කළ නොහැකි බව ය. එවැනි අවකාශයක් නිරීක්ෂණය කළ නොහැකි වන්නේ නිරීක්ෂකයකු ඒ අවකාශයට ගිය වහාම අවකාශයෙහි යමකු ඇති බැවින් ඒ තවදුරටත් ඉහත කී අර්ථයෙන් අවකාශයක් නොවන බැවිනි.

අයින්ස්ටයින් විද්වතාට ඉතා තියුණු වියුක්ත මනසක් තිබූ බව කීම අවශ්‍ය නො වේ. ඔහු අවකාශය සංකල්පයක් ලෙස ඉදිරිපත් කිරීමේ ගැටලුව තේරුම් ගත්තාට සැකයක් නැත. අවකාශය සංකල්පයක් ලෙස ඉදිරිපත් කිරීම ගැටලු සහගත වුවත් එහි එක්තරා ආකාරයකින් සමමිතියක් ඇත. අවකාශයෙහි වමක් දකුණක්, උඩක් පහතක්, ඉදිරියක් පසුපසක් ආදී වශයෙන් සමමිතිකයක් ඇත. අපට අවකාශයේ වම දකුණින් හෝ ඉදිරිපස පසුපසින් හෝ වෙනස් යැයි ගත හැකි නො වේ. ස්ථානීය වශයෙන් වෙනස්කම් තිබුණ ද විශ්වීය වශයෙන් ගත්කල අවකාශයෙහි එවැනි වෙනස්කම් නැතැයි සැළකෙයි. එහෙත් කාලය සම්බන්ධයෙන් කිව හැක්කේ කුමක් ද? එහි දී කාලයෙහි ඉදිරිපස (අනාගතය) පසුපස (අතීතය) සමග සමමිතික නො වේ. අවකාශය ගැන ද සංකල්පයක් ඇතිකර ගැනීම ගැටලුවක් නම් කාලය පිළිබඳ සංකල්පයක් ඇතිකර ගන්නේ කෙසේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva